# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය (පුනර්) ප්‍රථම වසර - 2019

## නීති විධික්‍රම

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න <u>හතරකට</u> පමණක් පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. නීතිය යනු සමාජ පාලනය සඳහා අත්‍යවශ්‍ය අංගයකි. එමනිසා, නීතිය සමාජයට හොඳින් ම මෙහෙවර කරන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම සඳහා විවිධ න්‍යායන් මතු වී ඇත.

   නීතිය සහ සමාජය අතර අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ අදහස් න්‍යායාත්මක කර ඇත්තේ කෙසේද යන්න ඕනෑම නීති ගුරුකුල දෙකක් භාවිත කරමින් පැහැදිලි කරන්න.

   **(ලකුණු 25)**

2. පද්ධති දෙකේම අංග බොහෝ විට සමපාත වන නමුත් 'එදිරිවාදී' සහ 'විමර්ශනවාදී' යුක්තිය පසිඳලීමේ පද්ධති අතර සැලකිය යුතු වෙනස්කම් පවතින බව නීති විශාරදයන් නිරීක්ෂණය කර ඇත.

   විනිසුරුවරයාගේ කාර්යභාරය පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් මෙම පද්ධති දෙකෙහි ක්‍රියාකාරිත්වය සන්සන්දනය කර පටහැනිතා දක්වන්න.

   **(ලකුණු 25)**

3. විනිශ්චයකාරවරු ව්‍යවස්ථාවක ලිඛිත වචනවලට පමණක් අවධානය යොමු කළ යුතු අතර වෙනස් අර්ථ නිරූපණයන් ලබා දීම සඳහා ඔවුන් එම වචනවලින් ඔබ්බට ගමන් නොකළ යුතුය.

ඔබ එකඟ වන්නෙහිද? අර්ථ නිරූපණ රීතීන් සහ අදාළ අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 25)

4. කන්ධාර් රාජ්‍යයට 2020 මුල් භාගයේ සිට කොවිඩ්-19 වෛරසය මගින් බලපෑම් එල්ල වී ඇත. වෛරසය පැතිරීම වැළැක්වීමේ ක්ෂණික සහ හදිසි පියවරක් ලෙස රජය විසින් 2020 කොවිඩ්-19 වැළැක්වීමේ පනත පනවන ලදි. පනතේ 5 වන වගන්තිය අනුව මහජනතාවට පොදු ස්ථානවල මුහුණු ආවරණ පැළඳීම අනිවාර්ය කර ඇත. තවද, 7 වන වගන්තිය දක්වන්නේ සෑම පුද්ගලයෙකුටම කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ යුතුකමක් පවතින බවත්, මෙම පනත යටතේ දක්වා ඇති පූර්ව ආරක්ෂණ පියවරවලට අනුගත නොවන තැනැත්තන් දඬුවමට ලක් වන බවත්ය.

කන්ධාර් හි අගනුවර දුම්රියපොළේ මුහුණු ආවරණ නොමැතිව ඇවිදිමින් සිටි පුද්ගලයින් කණ්ඩායමක් අහඹු පරීක්ෂාවකදී පොලිසිය සොයා ගනී. මෙම පුද්ගල කණ්ඩායම, කන්ධාර් හි සුළුතර ජන කොටසක් වූ ලුලු ප්‍රජාවට අයත් විය. ප්‍රජාවේ ප්‍රධානියා කියා සිටියේ ඔවුන්ගේ ප්‍රජාවේ දීර්ඝකාලීන සම්ප්‍රදායක් ලෙස පහළ කුලවල ජනතාව ඔවුන්ගේ මුහුණු ආවරණය කරන බවයි. ඉහළ කුලවලට අයත් ජනතාව, විෂබීජහරණයට උපකාරී වන බව විශ්වාස කළ නිසා කහ කැබැල්ලක් ඔවුන්ගේ ගෙලෙහි පළඳියි. ඔවුන් වැඩිදුරටත් කියා සිටියේ පූර්ව ආරක්ෂණ පියවර ගෙන ඇති නිසා ඔවුන් කිසිඳු නීතියක් උල්ලංඝනය කර නැති බවයි. ලුලු ප්‍රජාවේ පහළ කුලවල සාමාජිකයන් මුහුණු ආවරණ පැළඳ සිටි බව පොලිස් නිලධාරීහු තවද නිරීක්ෂණය කළහ.

මෙම චාරිත්‍රානුකූල පරිචයන්ගේ වලංගුභාවය පිළිබඳව ඔබගේ උපදෙස බලාපොරොත්තු වේ. කන්ධාර් හි නීති පද්ධතිය, ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන යැයි උපකල්පනය කරමින් ඔබගේ උපදෙස රචනා කරන්න.

(ලකුණු 25)

5. ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් සංවිධානය කරනු ලබන සම්මේලනයක දී "ශ්‍රී ලංකාව තුළ අධිකරණ පූර්ව නිදර්ශන න්‍යායේ භාවිතය: විවේචනාත්මක පැතිකඩක්" යන තේමාව යටතේ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනය කරනු ලැබ ඇතැයි උපකල්පනය කරන්න.

නීති ක්ෂේත්‍රයක් තෝරාගෙන, අධිකරණ පූර්ව නිදර්ශන න්‍යායේ මූලිකාංග ඉස්මතු කරමින් පත්‍රිකාවක් කෙටුම්පත් කරන්න.

**(ලකුණු 25)**

6. ආරවුලේ ස්වභාවය මත පදනම්ව කැමැති ආරවුල් විසඳීමේ ආකාරයක් ඉල්ලා සිටීමට පාර්ශවයන්ට හැකි කරවන ආකාරයේ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් ගෙන් සාරවත් සම්ප්‍රදායක් ශ්‍රී ලංකාව සතුය. සෑම ක්‍රමයකටම එයටම ආවේණික අරමුණු සහ ශිල්ප ක්‍රම මෙන්ම එහි වාසි සහ අවාසි ද පවතී.

ශ්‍රී ලංකාවේ ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස බේරුම්කරණය සංකල්පය අනුසාරයෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**(ලකුණු 25)**

7. නීති වෘත්තියේ ආචාර ධර්ම ඇසුරින් පහත අවස්ථාවන් සලකා බලන්න.

(අ) නීතිඥවරයෙකු වන නිරෝ, උසාවි සංකීර්ණය අසල රාජකාරියේ නියුතු පොලිස් නිලධාරියෙකු සමඟ සේවාදායකයන් පොළඹවාගැනීමට සහ ඔහුගේ නම සඳහන් කාඩ්පත් මහජනතාව අතර බෙදාහැරීමට රහසිගත ගිවිසුමක් ඇති කර ගනී. පොලිස් නිලධාරියාට නඩුවකට රු. 500ක් ගෙවීමට ද පොරොන්දු වේ;

(ආ) බෘනෝ නීතිඥවරයෙකු වන අතර නූනෝ එම කාර්යාලයේ ම සේවය කරන ඔහුගේ සහායකයාය. රට පුරා ස්ථාන කිහිපයක සුපිරි වෙළඳසැල් හිමි රානු ඔවුන්ගේ සේවාදායකයා වේ. නඩුව තහවුරු කිරීම සඳහා රානුට ඔහුගේ ආදායම නීතිඥවරයාට ප්‍රකාශ කිරීම අවශ්‍ය කර තිබුණි. ඔහුගේ නීතිඥයා සහ සහායකයා යන දෙදෙනාම ඔහුගේ ව්‍යාපාර ආදායම ඔහුගේ තරඟකරුවාට නඩුව අතරතුරදී සහ ඉන් අනතුරුව හෙළිකර ඇති බව පසුව ඔහු සොයා ගනියි;

(ඇ) විරුද්ධ පාර්ශවයන් නියෝජනය කරන නීතිඥවරුන් දෙදෙනෙකු වන ලාල් සහ සිරි නඩු විභාගය අතරතුරදී එකිනෙකාට අපහාස කර ගත්හ. ලාල්, සේවාදායකයන් සහ විනිශවයකාරවරයා ඉදිරිපිට දී නුසුදුසු වචන සහ ඔවුන්ගේ පුද්ගලික තොරතුරු දක්වමින්, සිරිට සහ ඔහුගේ සේවාදායකයාට කෑ ගැසුවේය;

(ඈ) නීතිඥවරයෙකු වන කරුට, ඔප්පුවක් ලියාපදිංචි කිරීම සඳහා ඔහුගේ සේවාදායකයාගෙන් මුදල් ලැබෙයි. නියම කර ඇති කාලය තුළදී කාර්ය සම්පූර්ණ කිරීමට කරු අසමත්වීම නිසා සේවාදායකයාට බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි විය. කරු, තම කාර්යාල පරිශ්‍රය නවීකරණය සඳහා එම මුදල වැය කරයි.

**(ලකුණු 25)**

********